- www.pastpapers.wiki -

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
වර්ෂ අවසාන ඇගයීම - 2018
විද්‍යාව
07 ශ්‍රේණිය

නම / විභාග අංකය :- .... කාලය : පැය 02 යි

සැලකිය යුතුයි:
- I කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

I කොටස

01. පරීක්ෂය සෑදීමට අවශ්‍ය තල දර්පණ ගණන,
(1) දෙකකි (2) තුනකි
(3) හතරකි (4) පහකි

02. ජලය නටන උෂ්ණත්වය,
(1) 373K (2) 100K
(3) 273K (4) 212K

03. සෝඩියම් ක්ලෝරයිඩ් නම් ලවණය බහුලව අඩංගු ස්ථානයකි,
(1) මිරිදිය ජලාශය (2) සාගරය
(3) පොකුණු (4) ගංගාව

04. රිකට්ස්/ රිකට්සියාව රෝගය සෑදෙන්නේ කුමන විටමින් වර්ගය අඩු වූ විටද?
(1) විටමින් B (2) විටමින් C
(3) විටමින් D (4) විටමින් A

05. බීජ පත්‍ර යුගලක් සහිත බීජ වර්ගයකි,
(1) වී බීජය (2) පුවක් බීජය
(3) බඩඉරිඟු බීජය (4) මුං බීජය

06. පැන්සල් නිෂ්පාදනයට යොදා ගන්නා ඛනිජයක් වන්නේ,
(1) මයිකා ය (2) මිනිරන් ය
(3) ඉල්මනයිට් ය (4) ඩොලමයිට් ය

07. බයිසිකල් ඩයිනමෝව තුළ,
(1) කරකැවෙන දඟරයක් ඇත (2) කරකැවෙන චුම්බයක් ඇත
(3) කරකැවෙන ලෝහ දණ්ඩක් ඇත (4) කරකැවෙන කාබන් කූරක් ඇත

08. පහත සංකේත අතරින් ධාරිත්‍රකයක සංකේතය තෝරන්න.
(1)

(2)

(3)

(4)


09. විශාලන බලය සහ විභේදන බලය ඉතා ම වැඩි අන්වීක්ෂය කුමක්ද?
(1) ආලෝක අන්වීක්ෂය (2) සරල අන්වීක්ෂය
(3) ඉලෙක්ට්‍රෝන අන්වීක්ෂය (4) සංයුක්ත අන්වීක්ෂය

- www.pastpapers.wiki -

- www.pastpapers.wiki -

10. ශාකවල ආහාර නිෂ්පාදන ක්‍රියාවලියේ දී ආහාර තුළ තැන්පත් වන ශක්තිය,
(1) රසායනික ශක්තියයි (2) ආලෝක ශක්තියයි
(3) තාප ශක්තියයි (4) විභව ශක්තියයි

11. මළ බද්ධය, අර්ශස් වැනි රෝග වැලදීමේ ප්‍රවණතාවය අඩු කරන ආහාර වර්ගයකි,
(1) පාන් (2) කොහිල
(3) හරක් මස් (4) බත්

12. පහත දැක්වෙන පස් වර්ගයක ලක්ෂණ කීපයකි.
- ලිහිල් ස්වභාවයක් ගනියි.
- පාංශු වාතය රැඳීම වැඩිය.
- පාංශු ජලය රැඳීම අඩුය.
- වීදුරු නිෂ්පාදනයට යොදා ගනියි.

මෙම පස් වර්ගය වන්නේ,
(1) වැලි පස ය. (2) මැටි පස ය.
(3) ලෝම් පස ය. (4) බොරලු පස ය.

13.


රූපයේ පරිදි දර්පණයට වැටෙන ආලෝකය පරාවර්තනයෙන් පසුව,
(1) අපසාරී වේ (2) සමාන්තර වේ
(3) වර්තනය වේ (4) අභිසාරී වේ

14. විකිරණශීලී මූලද්‍රව්‍ය දෙකකි.
(1) මැග්නීසියම් හා යුරේනියම්
(2) ප්ලූටෝනියම් හා මැග්නීසියම්
(3) ඇලුමිනියම් හා යුරේනියම්
(4) යුරේනියම් හා ප්ලූටෝනියම්

15. වායුගෝලය දූෂණයට හේතුවන ද්‍රව අංශුමය දූෂකයකි,
(1) කෘමිනාශක බිඳිති
(2) කාබන් මොනොක්සයිඩ්
(3) සල්ෆර් ඩයොක්සයිඩ්
(4) නයිට්‍රජන් ඩයොක්සයිඩ්

16.


ඉහත දැක්වෙන ක්‍රියාකාරකමේ තාපය ගමන් කරන ක්‍රමය වන්නේ,
(1) සංවහනයයි (2) විකිරණයයි
(3) සන්නයනයයි (4) ප්‍රසාරණයයි

17. ආහාර ජීර්ණ පද්ධතියට අයත් මහාන්ත්‍රයේ ප්‍රධාන කාර්යය වන්නේ,
(1) පෝෂක අවශෝෂණයයි (2) ආහාර ජීරණය සිදුවීමයි
(3) ජලය අවශෝෂණයයි (4) එන්සයිම ස්‍රාවය කිරීමයි

- www.pastpapers.wiki -

- www.pastpapers.wiki -

18. පරිසර දූෂණය අඩුවෙන්ම සිදුවන ශක්ති ප්‍රභව පමණක් අඩංගු පිළිතුර තෝරන්න.
    (1) ගලායන ජලයේ ශක්තිය, සූර්ය ශක්තිය
    (2) ගල් අඟුරු, න්‍යෂ්ටික ශක්තිය
    (3) භූතාප ශක්තිය, ජෛව ස්කන්ධ
    (4) ස්වාභාවික වායුව, ඛනිජ තෙල්

19. උපකරණ හා විදුලි උත්පාදන ක්‍රමය නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.
    (1) විද්‍යුත් කෝෂ - රසායනික ක්‍රියාවලියක්
    (2) ඩයිනමෝව - රසායනික ක්‍රියාවලියක්
    (3) ජනක යන්ත්‍ර - සූර්ය ශක්තිය මඟින්
    (4) සූර්ය කෝෂ - චලනය මඟින්

20. සත්‍ය ප්‍රකාශය තෝරන්න.
    (1) ජීවයේ ව්‍යුහමය හා කෘත්‍යමය ඒකකය පටකයයි
    (2) යම් විශේෂ කාර්යයක් ඉටු කිරීමට සෛල කිපයක් එකතුවී අවයවයක් සෑදෙයි
    (3) නිශ්චිත කාර්යයක් ඉටු කිරීමට අවයව කිපයක් එකතුවී සෛලය සෑදෙයි
    (4) පොදු කාර්යයක් ඉටු කිරීමට අවයව සමූහයක් සම්බන්ධ වී පද්ධතියක් සෑදෙයි

(ලකුණු 2 × 20 = 40)

- www.pastpapers.wiki -

II කොටස

සැලකිය යුතුයි:

- පළමු වන ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

01. (A) පසෙහි අඩංගු සංඝටක හඳුනාගැනීමට ශිෂ්‍ය කණ්ඩායම් දෙකක් සිදු කළ ක්‍රියාකාරකම් දෙකක් පහත දැක්වේ.



A කණ්ඩායම



B කණ්ඩායම

(i) A කණ්ඩායම් පරීක්ෂණ නළයේ ඉහළ කොටසේ කුඩා ද්‍රව බිංදු බැඳී ඇති බව නිරීක්ෂණය කරන ලදී.

(a) මෙම ද්‍රව බිංදු ජලය දැයි හඳුනා ගැනීමට යොදන රසායනික ද්‍රව්‍යය කුමක්ද? (ලකුණු 02)

(b) මෙම ද්‍රව බිංදු ජලය වූයේ නම් සිදුවන වර්ණ විපර්යාසය ලියා දක්වන්න. (ලකුණු 02)

(c) වර්ණ විපර්යාසයක් සිදුවේ නම් නිගමනය කළ හැක්කේ කුමක්ද? (ලකුණු 01)

(ii) (a) B කණ්ඩායම සිදු කළ ක්‍රියාකාරකමට අනුව නිරීක්ෂණය කුමක් විය හැකිද? (ලකුණු 02)

(b) එම නිරීක්ෂණය ඇති කිරීමට හේතු වූ ජීවී කාණ්ඩය නම් කරන්න. (ලකුණු 01)

(iii) ඔබට කුඩා පස් සාම්පලයක් සපයා දී තිබේ නම් පාංශු වාතය ඇති බව හඳුනා ගැනීමට ක්‍රියාකාරකමක් ලියන්න. (ලකුණු 02)

(B) රූපයේ දැක්වෙන්නේ ක්‍රීඩා පිටියකි. මෙම ධාවන පථයේ දිග මීටර් 400කි.



(i) ශිෂ්‍යයෙක් A නම් ස්ථානයෙන් තරගය ආරම්භ කර, එම ආරම්භක ස්ථානයෙන් ම තරගය අවසාන කරයි.

(a) ශිෂ්‍යයා ගමන් කළ දුර කීය ද? (ලකුණු 01)

(b) ශිෂ්‍යයාගේ විස්ථාපනය කොපමණ ද? (ලකුණු 01)

(ii) දුර හා විස්ථාපනය අතර ඇති වෙනස කුමක් ද? (ලකුණු 02)

(iii) බලය හා විස්ථාපනය මනින අන්තර්ජාතික ඒකක ලියන්න. (ලකුණු 02)

(මුළු ලකුණු 16)

02. (A) X නම් ස්ථානයේ තැබූ එක්තරා දර්පණයක් මගින් ඉටිපන්දම් දැල්ලක ප්‍රතිබිම්බයක් ලබා ගන්නා ආකාරය පහත රූපයේ දැක්වේ.



(i) X ස්ථානයේ තබා ඇති දර්පණයේ වර්ගය කුමක්ද? (ලකුණු 02)

(ii) එම දර්පණය නිසා සෑදෙන ප්‍රතිබිම්බයේ ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 01)

(iii) ඉටිපන්දම් දැල්ලේ ප්‍රතිබිම්බයේ සිට X නම් ස්ථානයට ඇති දුර හඳුන්වන නම කුමක්ද? (ලකුණු 01)

(iv) X නම් දර්පණය ඉටිපන්දම දෙසට ගෙන ආ විට ප්‍රතිබිම්බය මේ ආකාරයට ම පවතී ද? (ලකුණු 01)

(v) X දර්පණය රූප සටහනක් මගින් පෙන්වන්න (ලකුණු 01)

(B) පරීක්ෂණ ඇටවුමක රූප සටහනක් පහත දැක්වේ.



(i) ඉහත ඇටවුම සකස් කරන ලද්දේ කුමක් පරීක්ෂා කිරීමටද? (ලකුණු 01)

(ii) එහි දී ඔබ ලබා ගත් නිගමනය කුමක්ද? (ලකුණු 01)

(iii) සූර්යයාගේ සිට පෘථිවිය වෙතට තාපය ගමන් කරන්නේ කෙසේද? (ලකුණු 01)

(iv) ශ්‍රී ලංකාව වැනි රටවල බිත්තිවල ආලේප කිරීමට සුදුසු වන්නේ ළා වර්ණය ද? තද වර්ණය ද? (ලකුණු 01)

(v) ඊට හේතුව කුමක්ද? (ලකුණු 01)

(මුළු ලකුණු 11)

03. (A) ගලායන ජලය, ඛනිජ තෙල්, න්‍යෂ්ටික ශක්තිය, සූර්ය ශක්තිය, ජෛව ස්කන්ධය, ගල් අඟුරු

(i) ශක්ති ප්‍රභව කිපයක් ඉහත දැක්වේ. මේවා පුනර්ජනනීය ශක්ති ප්‍රභව සහ පුනර්ජනනීය නොවන ශක්ති ප්‍රභව ලෙස කොටස් දෙකකට වෙන් කරන්න. (ලකුණු 0

(ii) පුනර්ජනනීය ශක්ති ප්‍රභව යන්නෙන් අදහස් වන්නේ කුමක්ද? (ලකුණු 0

(iii) ඉන්දියාවේ ආහාර පිසීමට බහුලව යොදා ගන්නා ජෛව ස්කන්ධයක් වන සත්ත්ව අපද්‍රව්‍යය න කරන්න. (ලකුණු 0

(iv) ශක්ති ප්‍රභව තිරසර ලෙස භාවිත කිරීමට යෝජනා දෙකක් ඉදිරිපත් කරන්න. (ලකුණු 0

(B)

(i) වායුගෝලයේ වැඩි ම ප්‍රතිශතයක් අඩංගුවන වායුව කුමක්ද? (ලකුණු 0

(ii) වායුගෝලය හදිසියේ අතුරුදන් වුවහොත් අපට සිදු විය හැකි ගැටලු 2ක් සඳහන් කරන්න. (ලකුණු 0

(මුළු ලකුණු

04. (A) පහත දැක්වෙන වාක්‍ය හරි නම් '✓' ද, වැරදි නම් '×' ලකුණ ද ඉදිරියෙන් යොදන්න.

(i) ශක්තිය මැනීමේ අන්තර්ජාතික ඒකකය ජූල් වේ. (

(ii) වියළි කෝෂයක විද්‍යුත් ශක්තිය ගබඩා වී ඇත. (

(iii) පෘථිවි අභ්‍යන්තරය පිළිබඳ තොරතුරු සොයා ගැනීමට ගිනි කඳු පිපිරීමෙන් පොළව මතු පිටට ගලා එන ලාවා උපකාරී වේ. (

(iv) ඡායාව සෑදෙන්නේ ආලෝක ප්‍රභවයේ සම්පූර්ණ ආලෝකය නොලැබී යාම නිසා ය. (

(v) තල දර්පණයක් ඉදිරියේ 20cm දුරින් වස්තුවක් තබා ඇති විට ප්‍රතිබිම්බ දුර ද 20cm වේ. (

(vi) දිගු කාලයක් භාවිත නොකරන විට අන්වීක්ෂයක කාච කට්ටල ගලවා සිලිකා ජෙල් සහිත ඩෙසිකේටරයක තැබිය යුතුයි. (

(ලකුණු 0

(B) පහත සඳහන් වචන යොදා හිස්තැන් පුරවන්න.

කිරිගරුඬ, බැසෝල්ට්, මැග්මා, ඛනිජ, සල්ෆර්ඩයොක්සයිඩ්

(i) අධික උෂ්ණත්වයේ පවතින ද්‍රව පාෂාණ .... ලෙස හඳුන්වයි.

(ii) .... ආග්නේය පාෂාණ සඳහා නිදසුනකි.

(iii) හුනුගල් විපරිත වී .... සෑදේ.

(iv) .... සහිත ආම්ලික වර්ෂා නිසා පාෂාණ රසායනික ජීරණයට ලක් වේ.

(v) .... ස්ඵටිකවල විවිධ ජ්‍යාමිතික හැඩ දක්නට ලැබේ.

(ලකුණු

(මුළු ලකුණු

05. **(A)** පහත රූප සටහන් අධ්‍යයනය කරන්න.

මිනිසා

කැස්බෑවා

ගොළුබෙල්ලා


ගැඩවිලා

කපුටා

කකුළුවා


අලියා

මැඩියා

(i) ඉහත රූපවල සිටින සතුන් කොඳු ඇට පෙළක් තිබීම හා නොතිබීම අනුව කොටස් දෙකකට වෙන් කරන්න. (ලකුණු 04)

(ii) කොඳුඇට පෙළක් තිබෙන සතුන් කවර නමකින් හැඳින්වේ ද? (ලකුණු 01)

(B) රතු, කොළ, දුඹුරු වර්ණවලින් යුත් දිගින් සමාන ඉරටු කැබලි 100ක් බැගින් තණ පිට්ටනියක හා බොරළු පොළවක විසුරුවා හරින ලදී. සිසුන් දෙදෙනෙක් මිනිත්තු 03දී ඇහිඳ ගත් ඉරටු ප්‍රමාණයන් පහත වගුවේ දැක්වේ.

වර්ණ	තණකොළ පිට්ටනිය	බොරළු පොළව
රතු	38	21
කොළ	30	......
දුඹුරු	49	35

(i) තණකොළ පිට්ටනියේ දී කොළ පාට ඉරටු අඩුවෙන් අහුලා ගැනීමට හේතුව කුමක් ද? (ලකුණු 01)

(ii) බොරළු පොළවේ දී අහුලා ගත් කොළ පාට ඉරටු ප්‍රමාණය තණකොළ පිට්ටනියක දී අහුලා ගත් කොළ පාට ප්‍රමාණයට වඩා අඩුවේ ද? වැඩිවේද? (ලකුණු 01)

(iii) වෛශාන්තරණය යනු කුමක්ද? (ලකුණු 02)

(iv) පහත දැක්වෙන ජීවීන් පරිසරයට අනුවර්තන දක්වා තිබෙන්නේ කෙසේ ද?

(a) දිවියා -

(b) දළඹුවා - (ලකුණු 02)

(මුළු ලකුණු 11)

06. **(A)** කෙටි පිළිතුරු ලියන්න.

(i) ශාක මුල් මඟින් සිදුවන කාර්යයන් දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) පුෂ්පයක පුමාංගයට අයත්වන කොටස් දෙක මොනවා ද? (ලකුණු 02)

(iii) ස්ථිති විද්‍යුත් ආරෝපණ ගබඩා කළ හැකි උපාංගයක් නම් කරන්න. (ලකුණු 01)

(iv) සරල ධාරාවක් නිපදවා ගැනීමට භාවිත කළ හැකි කෝෂයක් නම් කරන්න. (ලකුණු 01)

(v) විද්‍යාගාරයේ දී හමුවන අම්ලයක් හා භෂ්මයක් පිළිවෙළින් ලියන්න. (ලකුණු 02)

(B) පහත දැක්වෙන ඉන්ද්‍රියන් අතර ආහාර ජීරණ පද්ධතියට හා ස්වසන පද්ධතියට අදාළවන ඉන්ද්‍රියන් තෝරා වගුවේ සටහන් කරන්න.

මහාන්ත්‍රය, අග්න්‍යාසය, ස්වාසනාලය, අක්මාව, ස්වරාලය, ක්ෂුද්‍රාන්ත්‍රය

පද්ධතිය	ඉන්ද්‍රියයන්
ආහාර ජීරණ පද්ධතිය	
ස්වසන පද්ධතිය	

(ලකුණු 03)

(මුළු ලකුණු 11)

07. ශිෂ්‍යයකුගේ දිවා ආහාර වේලක් පහත රූපයෙන් නිරූපණය වේ.



(i) මෙහි A, B, C ලෙස දක්වා ඇති ආහාර කාණ්ඩවල අඩංගුවන පෝෂණ සංඝටක මොනවාද?

A -

B -

C - (ලකුණු 03)

(ii) ඉහත දැක්වෙන ආහාරවේල තුලිත ආහාරයක් ද? (ලකුණු 01)

(iii) ඉහත පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 01)

(iv) ලිපිඩ ආහාරවල ප්‍රධානතම කාර්යය කුමක් ද? (ලකුණු 02)

(v) ලිපිඩවල අඩංගු ප්‍රධාන ආහාර සංඝටක දෙක නම් කරන්න. (ලකුණු 02)

(vi) ලිපිඩ ආහාරයක් හඳුනාගැනීමට කළ හැකි සරල ක්‍රියාකාරකම් ලියන්න. (ලකුණු 02)

(මුළු ලකුණු 11)

- www.pastpapers.wiki -

බස්නාහිර පළාත්
අවසාන වාර ඇගයීම් පරීක්ෂණය - 2018
පිළිතුරු

I කොටස

01. (1)	06. (2)	11. (2)	16. (3)
02. (1)	07. (2)	12. (1)	17. (3)
03. (2)	08. (3)	13. (4)	18. (1)
04. (3)	09. (3)	14. (4)	19. (1)
05. (4)	10. (1)	15. (1)	20. (4)

II පත්‍රය

01. (A)

(i) (a) නිර්ජලීය කොපර් සල්ෆේට්
නිර්ජලීය නොමැතිව කොපර් සල්ෆේට් ලියා ඇති විට

(b) සුදු → නිල්

(c) පසෙහි ජලය අඩංගු වේ

(ii) (a) රත් නොකළ පරීක්ෂණ නළයේ ඇති කිරි අනෙක් නළයේ ඇති කිරිවලට වඩා ඉක්මනින් කැටි ගැසේ.

(b) ක්ෂුද්‍ර ජීවීන්

(iii) (a) පස් කැටයක් ජල බඳුනකට දැමූ විට වාත බුබුළු පිටවන බව පෙනේ

(B)

(i) (a) මීටර් 400

(b) 0

(ii) දුර අදිශ රාශියකි. විස්ථාපනය දෛශික රාශියක් හෝ දුරට විශාලත්වයක් ඇතත් නිශ්චිත දිශාවක් නැත. විස්ථාපනයට විශාලත්වයක් හා නිශ්චිත දිශාවක් ඇත.

(iii) බලය → නිවුටන් / N
විස්ථාපනය → මීටර / m

02. (A)

(i) අවතල දර්පණ

(ii) යටිකුරු, තාත්වික

(iii) ප්‍රතිබිම්බ දුර

(iv) නැත

(v)



(B)

(i) වාතය තුළ තාපය ගමන් කරන ආකාරය

(ii) වාතය තුළ තාපය ගමන් කරන්නේ සංවහන ධාරා ලෙසය

(iii) විකිරණය

(iv) ළා වර්ණ

(v) ළා වර්ණ විකිරණ තාපය අඩුවෙන් උරා ගන්නා නිසා නිවෙස් ඇතුළත උණුසුම් නොවේ.

- www.pastpapers.wiki -

03. (A)

(i) පුනර්ජනනීය - ගලා යන ජලය, සූර්යය ශක්තිය, ජෛව ස්කන්ධ
පුනර්ජනනීය නොවන - ඛනිජ තෙල්, න්‍යෂ්ටික ශක්තිය, ගල් අඟුරු

(ii) භාවිත කරන අතරතුරදී හෝ කෙටි කාලයකින් නැවත හටගන්නා ශක්ති ප්‍රභව

(iii) ගොම

(iv)
- නිවසේ විදුලිය අරපිරිමැස්මෙන් භාවිත කිරීම
- කෙටි දුර පයින් යෑම හෝ පාපැදියෙන් යාම
- පුද්ගලික ප්‍රවාහන ක්‍රම වෙනුවට පොදු ප්‍රවාහන ක්‍රම යොදා ගැනීම

(B)

(i) නයිට්‍රජන්

(ii)
- සතුන්ට හා ශාකවලට අවශ්‍ය ඔක්සිජන් වායුව නොලැබීම
- ශාක ප්‍රභාසංස්ලේෂණයට අවශ්‍ය කාබන්ඩයොක්සයිඩ් වායුව නොලැබීම
- ශාක වර්ධනයට අවශ්‍ය N_2 වායුව නොලැබීම
- ජල චක්‍රය ක්‍රියාත්මක නොවීම

04. (A)

(i) ✓

(ii) ×

(iii) ✓

(iv) ✓

(v) ✓

(vi) ✓

(B)

(i) මැග්මා

(ii) බැසෝල්ට්

(iii) කිරිගරුඬ

(iv) සල්ෆර් ඩයොක්සයිඩ්

(v) ඛනිජ

05. (A)

(i) කොඳු ඇට පෙළක් ඇති - මිනිසා, කපුටා, අලියා, කැස්බෑවා, මැඩියා
කොඳු ඇට පෙළක් නැති - ගොළුබෙල්ලා, ගැඩවිලා, කකුළුවා

(ii) පෘෂ්ඨවංශීන්

(B)

(i) තණකොළවල කොළ පැහැයෙන් ඉරටුවල කොළ පැහැය වෙන් කර හඳුනා ගැනීමට නොහැකි වීම

(ii) වැඩි වේ

(iii) ශරීරයේ වර්ණය පරිසරයේ වර්ණය සමඟ ගැළපීම නිසා සත්ත්වයන් පහසුවෙන් පරිසරයෙන් වෙන් කර ගැනීමට අපහසු වීම

(iv) (a) සිරුර දූවිලි පැහැ වීම, පුල්ලි තිබීම
(b) විෂ රෝම තිබීම

06. (A)

(i)
- ශාකය පසට සවි කිරීම
- ජලය සහ ජලයේ දිය වූ ඛනිජලවණ උරා ගැනීම
- ඇතැම් ශාක මුල් මගින් නව ශාක බිහිවීම
- ආහාර ගබඩා කිරීම

(ii) පරාගධානිය, සූත්‍රිකාව

(iii) ධාරිත්‍රකය

- www.pastpapers.wiki -

(iv) සියලුම විදුලි කෝෂ හා බැටරි වර්ග

(v) අම්ල - හයිඩ්‍රොක්ලෝරික්, නයිට්‍රික්, සල්ෆියුරික්

භෂ්ම - NaOH, KOH, $Ca(OH)_2$

(B)

ආහාර ජීරණ - මහාන්ත්‍රය, අග්න්‍යාශය, අක්මාව, ක්ෂුද්‍රාන්තය

ස්වසන - ස්වාසනාලිකා, ස්වරාලය

07. (A)

(i) A ප්‍රෝටීන

B විටමින් හා ඛනිජ ලවණ

C කාබෝහයිඩ්‍රේට

(ii) ඔව්

(iii) පෝෂණ සංඝටක හා තන්තු අවශ්‍ය ප්‍රමාණයට අඩංගු ආහාරයක් නිසා

(iv) ශරීරයට අවශ්‍ය ශක්තිය ලබා දීම

(v) තෙල් හා මේද

(vi) ලිපිඩ ආහාර සුදු කඩදාසියක් මත තබා තෙරපූවිට පාරභාෂක පැල්ලමක් ලැබීම

- www.pastpapers.wiki -